# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2064/2 - 2018 මාර්තු මස 26 වැනි සඳුදා - 2018.03.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### දකුණු පළාතේ පළාත් සභාව

### 1983 අංක 32 හා 1992 අංක 11 දරන පනත් වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමූපකාර සමිති පනත

### බලතල පැවරීමේ නියෝග

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනත අනුව 1983 අංක 32 හා 1992 අංක 11 දරන පනත් වලින් සංශෝධිත 1972 අංක 5 දරන සමූපකාර සමිති පනතේ 2 (2) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දකුණු පළාත් සභාවේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජලසම්පාදන හා ජලපවහන, ආහාර සැපයීම් හා බෙදාහැරීම සහ සමූපකාර සංවර්ධන අමාත්‍ය උඩලමත්ත ගමගේ දයාවංශ ආරියතිලක වන මම, දකුණු පළාතේ සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමූපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයාට සහය වීම සඳහා පත්කර ඇත්තා වූ පහත දක්වා ඇති උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් අය වෙත 1983 අංක 32 හා 1992 අංක II දරන පනත්වලින් සංශෝධිත 1972 අංක 5 දරන සමූපකාර සමිති පනතේ හා ඒ යටතේ පනවා ඇති රීති ප්‍රකාරව සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත පැවරී ඇත්තා වූ එකී උපලේඛනයේ III වන තීරුවේ සඳහන් සියලු බලතල එකී උපලේඛනයේ II වැනි තීරුවේ සඳහන් දින සිට මෙයින් පවරමි.

උඩලමත්ත ගමගේ දයාවංශ ආරියතිලක,
කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, වාරිමාර්ග, ජලසම්පාදන හා
ජලපවහන ආහාර සැපයීම් හා බෙදාහැරීම සහ සමූපකාර සංවර්ධන අමාත්‍ය,
දකුණු පළාත.

2018 පෙබරවාරි මස 23 වැනි දින,
ගාල්ලේ දීය.


1A - PG3959 – 10 - (2018/03)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
| --- | --- | --- |
| බස්නායක ජගත් පෙරේරා මයා | 2018.02.01 | සමූපකාර සමිති පනත් : 3, 5, 6, 7, 8, 9, 33, 39, 42, 43, 44, 44(6) (හැර) 45, 46, 48, 49, 50, 52, 53, 54, 58, 58(2), (අ) හා 58(5) හැර 59, 68, 72 යන වගන්ති යටතේ රෙජිස්ට්‍රාර්වරයාගේ සියලු බලතල.<br><br>රීති මාලවේ : 4, 11, 15, 16, (II) 18, 19, 20, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 43, 48, 49, (49 xii හැර) 51, 52, සහ 53 දරන රීති යටතේ රෙජිස්ට්‍රාර්වරයාගේ සියලු බලතල. |

04 - 372

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.